ස්වදේශ කටයුතු චක්‍රලේඛ - 6/2017

මගේ අංක : සංවර්ධන-2017
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.
2017.05.22.

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන් හා
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

## දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පැවැත්වීම.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව දිස්ත්‍රික් මට්ටමේ දී ද, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව ප්‍රාදේශීය මට්ටමේ දී ද, තම බල ප්‍රදේශය තුල ඇති සියලු සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධීකරණය හා අධීක්ෂණය කරන ප්‍රධාන කමිටුව වේ. ඒ අනුව සියලු කමිටු, සංවර්ධන කටයුතු මනා සම්බන්ධීකරණයකින් වඩා විධිමත්ව සහ අදාළ සියලු පාර්ශවවල සහභාගීත්වයෙන් යුක්තව කරගෙන යාම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස මෙයින් දන්වමි.

1. ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරනු ලබන සියලු සංවර්ධන කටයුතු ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වලදී ද, දිස්ත්‍රික් ලේකම් බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරන සියලු සංවර්ධන කටයුතු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලදී ද, සාකච්ඡා කොට, පොදු එකඟතාවය මත සිදු කළ යුතුය.

2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාළ ගැටළු ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල දී සාකච්ඡා කළ යුතු අතර, එහිදී තීරණයක් ගත නොහැකි කරුණු පමණක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වෙතින් විසඳුම් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව සාකච්ඡා නොකළ කිසියම් කරුණක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡාව සඳහා ඉදිරිපත් වුවහොත් ඒවා නැවත ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කළ යුතුය.

3. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු ගත යුතු තීරණ, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් නොගත යුතුය. එහෙත් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මගින් විසඳා ගත නොහැකි බවට වාර්තා කර ඇති ගැටළු වෙතොත් ඒවා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කර විසඳා ගත යුතුය. එසේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණනාවකට බලපාන පොදු ප්‍රශ්නයක් ඇති විට හෝ හදිසි හෝ විශේෂ අවස්ථාවල යම් විශේෂ වැදගත්කමක් ඇති කරුණක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය නොමැතිව වුවද දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව ක්‍රියා කළ හැකිය.

4. දිස්ත්‍රික් ලේකම් විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු න්‍යාය පත්‍රය සැකසීමේ දී ඉහත කරුණු සලකා එය සැකසිය යුතුය. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතියක් නැති විෂයයන් ඉහත (අංක 03 හි අවස්ථාවලදී හැර) දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු න්‍යාය පත්‍රයට ඇතුලත් නොකළ යුතුය.

5. සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවක් විසින් ගන්නා ඇතැම් තීරණ රේඛීය අමාත්‍යාංශවල කටයුතු කෙරෙහි බලපාන අවස්ථාවකදී එම කමිටු තීරණය ක්‍රියාත්මක කිරීමට පෙර අදාළ රේඛීය අමාත්‍යාංශයේ සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟත්වය ඒ සඳහා ලබාගත යුතුය.

6. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට අදාළ කාර්යයන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් නොකළ යුතු අතර, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට අදාළ කාර්යයන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව විසින් නොකළ යුතුය. වගකීම පිළිබඳ අපැහැදිලිතාවයක් පවතී නම්, ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් විසින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් කල්වේලා ඇතිව ලබාගත යුතුය.

7. ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සඳහා වර්ෂයේ දින නියම කිරීමෙන් පසුව ජාතික මට්ටමේ හෝ දිස්ත්‍රික් මට්ටමේ හේතුවක් නිසා නොවේ නම් දින වෙනස් නොකළ යුතු අතර යම් යම් නියෝජිතයන්ට සහභාගිවීමට අපහසු වුවත්, එම කමිටුවට රැස්වීමේ හා ක්‍රියා කිරීමේ බලය ඇත. යම් රැස්වීමකට සම සභාපතිවරුන්ට සහභාගිවීමට නොහැකි වුවහොත් එහි සභාපතිත්වය දැරීමට යෝජනා ස්ථිරත්වයෙන් තාවකාලිකව සභාපතිවරයෙකු පත්කරගෙන එදින ඉදිරි කටයුතු කරගෙන යා යුතුය. ඒ අනුව පවත්වන රැස්වීමක කරන සියලු කාර්යයන් සම සභාපතිවරුන් විසින් සභාපතිත්වය දරණ ලද රැස්වීමක සිදුකරන කටයුතු මෙන්ම වලංගු විය යුතුය.

8. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පැවැත්වීමේ දින තීරණය කිරීමේ දී පාර්ලිමේන්තුව පළාත් සභා රැස්වීම පැවැත්වෙන දිනවලට හෝ කාර්යාලීය මහජන දිනය වන බදාදා දින වලට එම රැස්වීම් යොදා නොගත යුතුය.

9. ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා වැඩකරන දින 05 ක් තුළ අදාළ රැස්වීම් වාර්තාවේ පිටපත් සියලු ආයතන වෙත ලබාදිය යුතුවේ. එසේම එහි පිටපත් සෑම අවස්ථාවකම ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ද නිකුත් විය යුතුය.

10. ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡා කිරීමට එවනු ලබන යෝජනා රැස්වීම පැවැත්වීමට සති 03කට පෙර ලබාගත යුතුය. ඒවා අදාළ ආයතන වෙත යොමු කර පිළිතුරු ලබාගෙන එම පිළිතුරු කල්වේලා ඇතිව යෝජනාවට අදාළ අය වෙත යොමු කළ යුතුය. එම පිළිතුරෙන් සෑහීමකට පත්නොවේ නම් න්‍යාය පත්‍රය තුළ නැවත සාකච්ඡාවට භාජනය කළ හැකිය.

11. අතිගරු ජනාධිපතිතුමා හෝ ගරු අග්‍රාමාත්‍යතුමා හෝ පත්කළ නියෝජිතයින් හා මහජන නියෝජිතයින් හෝ රාජ්‍ය නිලධාරීන් අතර තීරණ ගැනීමේ ගැටළුවක් ඇතිවුවහොත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් පත් කරනු ලබන අනු කමිටුවක් වෙත යොමු කර වාර්තාවක් ලබාගත යුතුය. එය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡාවට භාජනය කළ හැකිය.

12. අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා හෝ ස්වදේශ කටයුතු අමාත්‍යතුමා විසින් වරින් වර පනවනු ලබන යම් යම් නීතිරීති වලට හෝ නියෝගවලට අනුව මෙම චක්‍රලේඛයේ කරුණුවලට සංශෝධන ඇතුලුවීම ඔබ වෙත අදාළ පරිදි දන්වනු ලැබේ.

13. අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා හෝ ගරු ස්වදේශ කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරියේදී මේ සම්බන්ධයෙන් යම් උපදෙස් හෝ චක්‍රලේඛ නිකුත් කළහොත් එහි පිටපත් සම්බන්ධීකරණ කමිටුවල සියලු සාමාජිකයන් වෙත ලබා දීම ප්‍රාදේශීය ලේකම්ගේ හා දිස්ත්‍රික් ලේකම්ගේ වගකීම වේ.

14. ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු නියෝජනය කරන යම් රාජ්‍ය නිලධාරියෙකු සම්බන්ධයෙන් යම් චෝදනාවක් ඇතොත් එය ප්‍රසිද්ධියේ සභාවේ සාකච්ඡා නොකළ යුතු අතර, අදාළ පරිදි ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම්/දිසාපති සමන්විත කමිටුවකට ඉදිරිපත් කර රැස්වීමට පෙර අධ්‍යයනය කර අදාළ වාර්තා සභාව ආරම්භ වීමට පෙර සම සභාපතිවරුන් හා අවශ්‍ය නියෝජිතයන් සමග සාකච්ඡා කොට තීරණයක් ගත යුතුය. ඒ බව ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ද වාර්තා කළ යුතු අතර පිටපත් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ද යොමු කළ යුතුය.

15. දිස්ත්‍රික්කයේ කටයුතු ජාතික වශයෙන් බලපාන කරුණු වලදී අතිගරු ජනාධිපතිතුමාගේ හෝ ගරු අග්‍රාමාත්‍යතුමාගේ අනුමැතියකින් තොරව ක්‍රියා නොකළ යුතුය. එවැනි කරුණු සියල්ල

ජනාධිපති ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත සම්පූර්ණ වාර්තාවක් මඟින් ඉදිරිපත් කර අනුමැතිය ගැනීම දිස්ත්‍රික් ලේකම්ගේ වගකීමක් වේ.

16. ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ න්‍යාය පත්‍රයෙන් බාහිරව සාකච්ඡා කළ හැක්කේ ජනතාවට බලපාන හදිසි අත්‍යාවශ්‍ය කරුණු පමණි. එවැන්නක් සාකච්ඡාවට ගැනීමට පෙර සම සභාපතිවරුන් හා ප්‍රාදේශීය ලේකම්/ දිස්ත්‍රික් ලේකම් එය අනුමත කළ යුතුය.

17. සෑම රැස්වීමකම කටයුතු අවසන් වනතුරු ප්‍රධාන නිලධාරීන් සියලුම දෙනා අනිවාර්යයෙන්ම රැඳී සිටිය යුතුය.

18. සෑම ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමක්ම නියමිත වේලාවට ආරම්භ විය යුතුය. නියමිත වේලාවට සභාව පැවැත්වීමේ වගකීම ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් සතු වේ. එසේම එය උපරිම වශයෙන් පැය 2 ½ -3කට සීමාවන අයුරින් (ප්‍රාදේශයේ හදිසි අවස්ථාවකදී හැර) ආයතන ප්‍රධානීන්ට තම හදිසි රාජකාරිවලට බාධා නොවන අයුරින් පැවැත්විය යුතුය.

19. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ දිස්ත්‍රික්කයේ අවශ්‍යතාවයන් සලකා අතිගරු ජනාධිපතිතුමා විසින් සම්බන්ධීකරණ කමිටු සඳහා සම සභාපතිවරුන් පත්කර ඇත. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පත්කර ඇති සම සභාපතිවරුන් නිල බලයෙන්ම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ද සාමාජිකයින් වේ. ඒ සියලු සාමාජිකයින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමට සහභාගි විය යුතුය.

20. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමට එම බල ප්‍රදේශයන් පිටතත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීමට එම දිස්ත්‍රික්කයෙන් පිටතත් රාජ්‍ය නිලධාරීන් කැඳවා ඇති යම් අවස්ථාවක ඔවුන්ගේ වැඩ කටයුතු අවසන් වීමෙන් අනතුරුව පිටව යාමට අවශ්‍ය වුවහොත් ඒ ආයතනයට අදාළ ගැටලු කිසිවක් ඇත්ද යන්න සභාවෙන් විමසා වෙනත් ගැටලු නොමැතිනම් පිටවී යාමට අවස්ථාව ලබා දිය හැකිය.

21. සෑම රැස්වීමකටම දේශපාලන අධිකාරියේ නියෝජිතයින්, රාජ්‍ය නිලධාරීන් එම සභාවට ගැලපෙන පරිදි ජාතික ඇඳුම හෝ නිල රාජකාරි ඇඳුමින් සහභාගි විය යුතුය.

22. ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය මත ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට හෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට අමාත්‍යාංශයේ නියෝජිතයෙකු පත්කල හැකිය.

23. යම් ප්‍රශ්නයකට අදාළ තීරණ ගැනීමට හෝ තීන්දු ගැනීමට සහය පළ කිරීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට හෝ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට විවිධ පුද්ගලයන් කැඳවිය නොහැකිය. එවැනි මත අවශ්‍යනම් දින කිහිපයකට පෙර කැඳවා මතය ගෙන ලිඛිතව දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් වෙත දැන්විය යුතුය.

24. කමිටු රැස්වීමට අදාළ නොමැති වුවත් විශේෂ අවස්ථාවලදී එම ඕනෑම අයෙකු කැඳවීමට සම සභාපතිවරුන්ට හා දිස්ත්‍රික් ලේකම්ට හෝ ප්‍රාදේශීය ලේකම්ට බලය ඇති නමුත්, එම කැඳවීම එම රැස්වීමට සීමා කළ යුතු අතර සභාවට නොගැලපෙන, අයත් නොවන නියෝජිතයින් සහභාගිවීම වැළැක්විය යුතුය.

25. ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව රැස්වීම් සඳහා එම කෝට්ඨාසයේ/ දිස්ත්‍රික්කයේ මාධ්‍යවේදීන්ට සහභාගිවීමට හැකිය. ඒ අයගේ නාම ලේඛණය ප්‍රාදේශීය/ දිස්ත්‍රික් ප්‍රවෘත්ති නිලධාරීන් දැනගත යුතුය. මාධ්‍යවේදීන්ට අවශ්‍යකරන පහසුකම් සැපයීමේ වගකීම ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යයකි.

26. ඉඩකඩ ප්‍රමාණවත් නොවන්නේ නම් එකම මාධ්‍ය ආයතනයකින් කිහිපදෙනෙකු සහභාගිවීම සීමා කරගත හැකිය. මාධ්‍යවේදීන්ට සභාවේ කරුණු වාර්තා කිරීමට හැකිවන අතර, මාධ්‍යට කරුණු ඉදිරිපත් කිරීම රැස්වීම අවසානයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපති, මහජන නියෝජිතයින්ට වෙනම සාකච්ඡාවක් පැවැත්විය හැකිය.

27. සියලු වාර්තා ලිඛිතව හා පටිගතකර තබා ගැනීමේ වගකීම ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම්ගේ වගකීමක් වේ. අදාළ ආයතනවල මාධ්‍ය අංශය හෝ වගකීම් දරණ අංශය විසින් ඒවා ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ද ඉදිරිපත් කල යුතුය.

28. පළාතේ දේශපාලන නියෝජිතයින්ගේ නිරාකරණය නොවූ ගැටළු වෙතොත් පළාතේ ප්‍රධාන අමාත්‍ය හෝ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ගේ කමිටුවකට ඉදිරිපත් කර නිරාකරණය කළ යුතුය.

29. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සංවර්ධන කටයුතු සාකච්ඡා කරන ප්‍රධාන රැස්වීම බැවින්, සෑම අමාත්‍යාංශයකට/දෙපාර්තමේන්තුවකම තීරණ ගත හැකි මට්ටමේ නිලධාරියෙකු මේ සඳහා සහභාගි කරවීමට වැඩ පිළිවෙලක් යෙදිය යුතුය. එසේම රැස්වීම සඳහා කල් ඇතිව සූදානම් වී යාම පිළිබඳව ද අදාළ නිලධාරීන් දැනුවත් කළ යුතුය.

30. ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් විසින් සහභාගි නොවූ නිලධාරීන් පිළිබඳව විශේෂ දැක්වීමක් නොකළා වුවද රැස්වීම් වාර්තාව අනුව තම නිලධාරියා/නිලධාරීන් සහභාගි නොවී ඇති බව පෙනී ගිය හොත් අදාළ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් එම තත්ත්වය නිවැරදි කිරීමට වහා පියවර ගත යුතුය.

31. ජාතික ලැයිස්තු ගරු මන්ත්‍රීවරයෙකු යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට සංවර්ධන මුදල් වෙන්කර ඇත්නම් එම කොට්ඨාසයේ/එම දිස්ත්‍රික්කයේ සම්බන්ධීකරණ කමිටු රැස්වීමට ඔහුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැකිය. ඔහුගේ නියෝජිතයෙකු සහභාගි වන්නේ නම් එහිදී ඔවුන් මුදල් වෙන් කර ඇති කරුණට අදාළව හැර වෙනත් කිසිදු කරුණු සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව නැත.

නීල් ද අල්විස්
ලේකම්
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

**පිටපත් :-**

01. සියලුම පාර්ලිමේන්තු ගරු මන්ත්‍රීවරුන්
02. සියලුම පළාත් සභා ගරු මන්ත්‍රීවරුන්
03. සියලුම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සම සභාපතිවරුන්
04. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය.
05. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය.
06. සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් - සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් දැනුවත් කිරීමට
07. සියලුම ප්‍රධාන ලේකම්වරුන් - සියලුම පළාත් සභා දෙපාර්තමේන්තු ප්‍රධානීන් දැනුවත් කිරීමට
08. සියලුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්
09. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහ භාණ්ඩාගාරය
10. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය
11. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය
12. විගණකාධිපති
13. සියලුම පළාත් පාලන ආයතනවල ලේකම්වරුන්